මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාව - 2021

---

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

මානව සම්පත් සංවර්ධනය කිරීමේ ශ්‍රී ලංකා ජාතික සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, ජාතික සභාවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ජාතික සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය ජාතික සභාව ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ජාතික සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, ජාතික සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

-----------------------------------------------------------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් ,චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය , ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ජාතික සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ජාතික සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;
- යම් අදාළ ලිඛිත නීතියකට හෝ ජාතික සභාවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව ජාතික සභාව ක්‍රියා කර ඇති බව,
- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,
- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරිබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් "මනාලෙස සැලසුම් කරන ලද" අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රාජ්‍ය ප්‍රාග්ධන ප්‍රදාන යටතේ මිලදී ගෙන සම්පූර්ණයෙන් ක්ෂය කර අවසන් වූ මෝටර් රථ 2016 වර්ෂයේදී ප්‍රත්‍යාගණනය කර එහි ක්ෂය වියදම සාමාන්‍ය පරිදි හඳුනාගෙන මූල්‍ය ප්‍රකාශනයන්හි ගලපා තිබුණද එම ක්ෂය ප්‍රමාණයට සමාන අගයක් තව දුරටත් විලම්භිත ආදායම් ලෙස ආදායමට ගැලපීම හේතුවෙන් වර්ෂයේ ලාභය රු.1,823,306 ක් හා සමුච්චිත අතිරික්තය රු.12,376,694 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මෙය නිවැරදි කරන ලෙස උපදෙස් දෙන ලදී. | ක්ෂය කර අවසන් වූ වත්කම් ප්‍රත්‍යාගණනයෙන් පසුව ඇතිවන ක්ෂය කිරීම් විලම්භිත ආදායම් ලෙස හඳුනාගත නොහැකි බැවින් නිවැරදිව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට කටයුතු කළ යුතුය. |

**1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| 30/2016 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | චක්‍රලේඛයේ 3.3 වගන්ති ප්‍රකාර අවසන් වරට ඉන්ධන පරීක්ෂාව සිදුකල දින සිට පාවිච්චි කල ඉන්ධන ප්‍රමාණය හා පසුගිය මාසයේ පාවිච්චි වූ ඉන්ධන ප්‍රමාණය පිළිබඳ සටහන් සකස් කර නොතිබුණි. | ඉදිරියේදී චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කිරීමට එකඟ වෙමි. | චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතුය. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵල**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 1,193,977 අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 5,743,332 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 6,937,309 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට ක්‍රමක්ෂය ආදායම රු. 2,992,446 කින් වැඩිවීම සහ ක්ෂය වියදම රු. 1,631,782 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 1997 අංක 18 දරන මානව සම්පත් සංවර්ධනය කිරීමේ පනත යටතේ පිහිටුවා ඇති මානව සම්පත් සංවර්ධනය කිරීමේ ජාතික සභාවේ මූලික කාර්යය සහ කර්තව්‍ය ලෙස ජාතික මානව සම්පත් සංවර්ධනය කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීම හා එය කාලීනව සමාලෝචනය කිරීම, මානව සම්පත් සංවර්ධනය පිළිබඳ අමාත්‍යවරයාට හා රජයට උපදෙස් ලබාදීම දක්වා තිබුණද ආයතනය පිහිටුවා වසර 23 ක් ගත වී ඇතත් ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් සකස් කර නොතිබුණි. | රජයේ නව දැක්ම යටතේ ආවරණය වන විෂය ක්ෂේත්‍රය අනුව “සෞභාග්‍යයේ දැක්ම” සමඟ සමපාත වන ජාතික මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තියක් සම්පාදනය කිරීමට සැලසුම් කොට ඇත. ඒ අනුව, අප සභාව විසින් දැනටමත් උපදේශන කමිටුවක් සහ අදාළ ක්ෂේත්‍රවල විශේෂඥයන්ගෙන් සමන්විත ක්‍රියාකාරී කමිටුවක් නම් කර ඇති අතර මෙම කමිටුව හරහා මානව සම්පත් සංවර්ධන ප්‍රතිපත්තිය සකස් කිරීමට බලාපොරොත්තු වේ. මේ වන විට අප සභාව විසින් අදාළ සියලුම අංශ ආවරණය වන පරිදි සැලසුම් කෙටුම්පතක් සකස් කර ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව මූලිකම අරමුණවත් ඉටු කර නොතිබියදී වසර 23ක් දක්වා මෙම ආයතනය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය විගණනයේදී ගැටළුකාරී විය. |

| | | | |
|---|---|---|---|
| (ආ) | පනතේ 16(2)ඊ වගන්තිය අනුව මානව සම්පත් සංවර්ධනයට අදාල විවිධ ක්ෂේත්‍ර පිළිබඳව තොරතුරු ඇතුලත් දත්ත බැංකුවක් පවත්වාගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. | මෙම දත්ත බැංකුවක් නිර්මාණය කිරීමට ප්‍රමානවත් නිපුණ දැනුමැති නිලධාරියෙකු නොමැති බැවින් උපදේශකවරයෙකුගේ සේවය ලබා ගැනීම මගින් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරමින් ඇත. | පනතේ විධිවිධාන ප්‍රකාරව මූලිකම අරමුණවත් ඉටු වී නොතිබියදී වසර 23 දක්වා මේ ආයතනය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය විගණනයේදී ගැටළුකාරී විය. |
| (ඇ) | පනතේ 16(2)(1) හි (එ )සහ (ඒ) වගන්ති අනුව සභාවේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් විශේෂඥ කණ්ඩායම් බඳවාගැනිම සඳහා ආයතනයට බලතල ලබාදී තිබුණද 1997 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා ඒ අනුව කටයුතු කර නොතිබීම හේතුවෙන් ආයතනයේ කාර්යසාධනය හා බලතල ඉටු කිරීම සම්බන්ධයෙන් සෘජු බලපෑමක් ඇති වී තිබුණු බව විගණනනයේදී ආවරණය විය. | විශේෂඥ කණ්ඩායම පිහිටුවීම සඳහා දැනට තෝරාගත් විශේෂඥයින්ගෙන් කැමැත්ත ලබා ගෙන ඇති අතර ඉදිරි පාලක මණ්ඩල රැස්වීමට එම විශේෂඥ සංචිතය ඉදිරිපත් කිරීමට නියමිත ය. පාලක මණ්ඩල අනුමැතිය ලබා ගැනීමෙන් පසු එම විශේෂඥ කණ්ඩායමේ සේවය ඉදිරි ව්‍යාපෘති සඳහා ලබා ගැනීමට නියමිතය. | පනතේ විධිවිධාන ප්‍රකාරව මූලිකම අරමුණවත් ඉටු වී නොතිබියදී වසර 23 දක්වා මේ ආයතනය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය විගණනයේදී ගැටළුකාරී විය. |

## 3.2 වෙනත් සංවිධානවල සම්පත් උපයෝජනය කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| 2016 පෙබරවාරි මාසයේ සිට සභාව විසින් භාවිතා කරනු ලබන ආර්ථික ප්‍රතිපත්ති හා සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සතු කැබ් රථය පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. | අමාත්‍යාංශය වෙත ලිඛිත ඉල්ලීමක් කලද, අයිතිය පවරා දීමක් සිදු නොකරන ලදී. | වාහන අළුත්වැඩියා කටයුතු සහ අනෙකුත් වියදම් දරන බැවින් අයිතිය පවරා ගැනීමට කටයුතු කල යුතු වීම. |